# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2485/59 - 2026 අප්‍රේල් මස 24 වැනි සිකුරාදා - 2026.04.24**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**වයඹ පළාතේ පළාත් සභාව**

වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ නිවේදන

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු සංශෝධිත මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 277 (1අ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වයඹ පළාත් ආණ්ඩුකාරවර තිස්ස වර්ණසූරිය වන මම පුත්තලම මහා නගර සභාවේ නාගරික මන්ත්‍රී එස්. එම්. ඉෂාම් මරික්කාර් මහතා විසින් සංශෝධිත මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 277 (1) වගන්තියේ සඳහන් වැරදි කිසිවක් සිදුකර ඇත්තේද යන්න පිළිබඳව මෙම දැන්වීමේ දින සිට මාස තුනක කාල සීමාවක් ඇතුළත පරීක්ෂා කොට මා වෙත වාර්තා කිරීම සඳහා විශ්‍රාමලත් අධිකරණ නිලධාරි විසුරුමාන ආරච්චිදේවගේ හේමචන්ද්‍ර කුලරත්න මහතා මෙයින් පත් කරමි.

මෙම නිලධාරියාට මෙම පරීක්ෂණයට අදාළව පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද කොමිසමක බලතල ඇත්තේය.

**තිස්ස වර්ණසූරිය,**
වයඹ පළාත් ආණ්ඩුකාරවර.

2026 අප්‍රේල් මස 24 වැනි දින,
කුරුණෑගල දී ය.

EOG 04 - 0208